# රාජ්‍ය දැව සංස්ථාව
## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

## 2023 වසර සඳහා දැවමය ගෘහ භාණ්ඩ , දැව ආශ්‍රිත නිෂ්පාදන හා දැවමය කලාත්මක නිර්මාණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

රාජ්‍ය දැව සංස්ථාව 2023 වර්ෂයට අදාලව පහත සඳහන් ප්‍රධාන දැවමය කාණ්ඩ සඳහා සැපයුම් කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට කැමති නිෂ්පාදනකරුවන්, නියෝජිතයන්, ආනයනකරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

**දැවමය ගෘහ භාන්ඩ**

**දැව ආශ්‍රිත නිෂ්පාදන** — ***බිම් ඇතුරුම් ලෑලි , බිත්ති ඇතුරුම් ලෑලි හා වෙනත් දැව ආශ්‍රිත නිෂ්පාදන***

**දැවමය කලාත්මක**

දැව භාණ්ඩ වල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වන සැපයුම්කරුවන් නියම කරන අවස්ථාවලදී රාජ්‍ය දැව සංස්ථාවේ ඉරූ දැව යොදා ගනිමින් දැව භාණ්ඩ නිෂ්පාදනය කර සැපයීම සඳහා ප්‍රමුඛ අවධානය යොමුකල යුතු අතර දැව නොවන උපාංග සඳහා රාජ්‍ය දැව සංස්ථාව මගින් ලබාදෙන ප්‍රමිතිමාන අනුගමනය කල යුතුය.

**අයදුම්පත් බාරදීම**

A. අයදුම්පත් නිකුත්කරන අවසන් දිනය හා වේලාව: 2023.06.23 දින ප.ව.3.00 දක්වා වේ.

B. සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2023.06.30 දින පෙ.ව. 11.30 ට පෙර එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ ඉහල වම් පස "**2023 වසර සඳහා දැවමය ගෘහභාණ්ඩ , දැවමය නිෂ්පාදන හා දැවමය කලාත්මක නිර්මාණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**" යනුවෙන් සඳහන් කල යුතුය.

C. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කල අයදුම්පත් අවශ්‍ය සැපයුම්කරුවන් විසින් අදාල ආයතනයේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත්කල යුතු අතර සතියේ වැඩකරන දිනයන්හීදී ආපසු නොගෙවන ලංසු පත්‍රිකා ගාස්තු ගෙස **රු. 500**/= ක් ගෙවා 2023.06.23 දින දක්වා රාජ්‍ය දැව සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල වෙතින් ලබාගත හැකිය.

D. පහත සඳහන් කරුණු සම්පූර්ණ කල හැකි සැපයුම් කරුවන් අයදුම්පත් ඉදිරිපත්කල හැකිය
- වගකීම් කාලයෙන් පසු සේවා සැපයීම.
- දිවයින පුරා නොමිලේ ප්‍රවාහනය කිරීම.
- භාණ්ඩ නොමිලේ ස්ථානගත කිරීම.
- සැපයුම්කරුගේ නිෂ්පාදන සහතිකය අත්‍යවශ්‍ය වේ.
- කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.
- භාණ්ඩ ඇණවුම්කර දින 7 ක් තුල භාණ්ඩ සැපයීම. (තොග ඇත්නම්)
- දිගුකාලීනව ස්ථාවර මිලක් ලබා දීමේ හැකියාව.
- දිගුකාලීනව ණය පහසුකම් ලබා දීමේ හැකියාව.
- රාජ්‍ය දැව සංස්ථාවේ බත්තරමුල්ල, රත්මලාන හා බූස්ස ප්‍රදර්ශනාගර වල සාම්පල ප්‍රදර්ශනය කිරීමේ හැකියාව.

E. ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් මිල ගණන් කැඳවන් ලැබේ.

F. අයදුම්පත් පිලිගැනීම හෝ ප්‍රතික්ශේප කිරීම රාජ්‍ය දැව සංස්ථාව සතුවේ.

G. වැඩිදුර විස්තර හා පැහැදිලි කරගැනීම සඳහා 071 968 0217 අංකය මගින් ගිහාන් මධුසංක මහතා අමතන්න.

**සාමාන්‍යාධිකාරී**
**රාජ්‍ය දැව සංස්ථාව**

**දුරකථන අංක : 011-2866636**
**වෙබ් අඩවිය: www.timco.lk**